රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2010

මගේ අංකය : EST7/LOANS/04/3112
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2010.08.10

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## 2010 මැයි මස ඇති වූ අධික වර්ෂාව හා සුළි සුළං තත්ත්වය මත විපතට පත් රජයේ නිලධාරීන්ට විශේෂ අත්තිකාරම් මුදලක් ලබාදීම

2010 මැයි මස දිවයින තුල ඇති වූ අධික වර්ෂාව හා සුළි සුළඟින් විපතට පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පදිංචි සුදුසුකම් ලත් රජයේ නිලධාරීන්ට පොලී රහිත විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට තීරණය කර ඇත.

02. මෙම විශේෂ ණය මුදල නිලධාරියාගේ එක් මසක දීමනා රහිත ඒකාබද්ධ වැටුපට සමාන විය යුතු අතර. සමාන මාසික වාරික දහයකින් ආපසු අයකර ගත යුතුය.

03. මෙම ණය මුදල ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 3 වගන්තියේ සඳහන් වැටුපෙන් අඩුකල හැකි මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාවන්ගෙන් නිදහස් වේ.

04. ණය මුදල ඉල්ලීමේ දී නිවසට හා බඩු බාහිරාදියට සිදුවී ඇති අලාභහානි පිළිබඳව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය.

05. මෙම ඇස්තමේන්තුව ප්‍රකාර අලාභහානි සිදුවී ඇති බව අදාල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් සනාථ කලයුතු අතර, ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කළ යුතුය.

06. නිලධාරියා හෝ ඔහුගේ පවුලේ අය පදිංචිව සිටින්නාවූ ද නිලධාරියාට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ අයිතිවූ ද නිවසකට, බඩු බාහිරාදියට අලාභහානි වී තිබේ නම් ඒවා අලුත්වැඩියා කිරීම සඳහා ද ණය ලබාගත හැකිය.